අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2018 ජුනි

General Certificate of Education (Adv. Level) Examination, June 2018

රසායන විද්‍යාව I
Chemistry I

02 S I

පැය දෙකයි
Two hours

13– ශ්‍රේණිය, Grade -13

අවසාන වාර විභාගය Final Term Test

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු 09 කින් යුක්ත වේ.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1) (2) (3) (4) (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරාගෙන, එය උත්තර පත්‍රයේ කතිරයක් යොදා දක්වන්න.

සාර්වත්‍ර වායු නියතය $R = 8.314\ J\ K^{-1}\ mol^{-1}$
ඇවගාඩ්රෝ නියතය $N_A = 6.022 \times 10^{23}\ mol^{-1}$
ප්ලෑන්ක්ගේ නියතය $h = 6.626 \times 10^{-34}\ Js$
ආලෝකයේ ප්‍රවේගය $C = 3 \times 10^{8}\ m\ s^{-1}$

1) කැතෝඩ කිරණ අංශුවක පැවතිය හැකි ආරෝපණය, ප්‍රමාණාත්මකව සොයා ගනු ලැබුවේ
1) තොම්සන් 2) මිලිකන් 3) මෝස්ලි 4) කෲක්ස් 5) මාර්ස්ඩෙන්

2) පහත කුමන යුගලය සමාන හැඩය දක්වයිද ?
1) $NF_3$ සහ $BF_3$ 2) $BCl_3$ සහ $NO_2^-$ 3) $NH_3$ සහ $N_3^-$
4) $BF_4^-$ සහ $NH_4^+$ 5) $PCl_3$ සහ $NH_2^-$

3) ස්කන්ධය 0.60 g වූ $Na_2CO_3$ හා $(NH_4)_2Cr_2O_7$ පමණක් අඩංගු මිශ්‍රණයක් තාප වියෝජනයට ලක්කරන ලදි. ලැබුණු ශේෂයේ ස්කන්ධය 0.50 g විය. මිශ්‍රණයේ $(NH_4)_2Cr_2O_7$ ස්කන්ධය ගණනය කරන්න.
(Na = 23, C = 12, O = 16, Cr = 52, H = 1, N = 14)
1) 0.750g 2) 0.675g 3) 0.440g
4) 0.252g 5) 0.124g

4) $Ag^+(aq) + 2NH_3(aq) \rightleftharpoons [Ag(NH_3)_2]^+(aq)$ යන ප්‍රතික්‍රියාවේ දී $Ag^+$ අයනය ක්‍රියා කරනුයේ
1) ඔක්සිකාරකයක් ලෙසය. 2) ඔක්සිහාරකයක් ලෙසය. 3) ලුවිස් අම්ලයක් ලෙසය.
4) නියුක්ලියෝෆයිලයක් ලෙසය. 5) ලුවිස් භෂ්මයක් ලෙසය.

5) BaO(s)හි සම්මත උත්පාදන එන්තැල්පියට අනුරූප වන්නේ පහත දැක්වෙන කුමන රසායනික ප්‍රතික්‍රියාවේ එන්තැල්පි වෙනසද ?
1) $Ba^{2+}(g) + O^{2-}(g) \longrightarrow BaO(s)$
2) $Ba(s) + O(g) \longrightarrow BaO(s)$
3) $Ba(s) + O_2(g) \longrightarrow BaO(s)$
4) $Ba(s) + \frac{1}{2}O_2(g) \longrightarrow BaO(s)$
5) $Ba(g) + \frac{1}{2}O_2(g) \longrightarrow BaO(s)$

alsciencepapers .blogspot.com



Scanned by CamScanner

6) Tin(II) oxalate 1 mol ක් සමඟ සම්පූර්ණයෙන්ම ප්‍රතික්‍රියා කිරීමට අවශ්‍යය ආම්ලික $K_2CrO_4$ මවුල සංඛ්‍යාව කොපමණද ?

1) $\frac{2}{3}$ 2) $\frac{4}{3}$ 3) 4 4) 8 5) 12

7) පහත සංයෝගයේ IUPAC නම කුමක්ද ?



alsciencepapers .blogspot.com

1) 3 – ethyl – 3 – formyl – 5 – hexynoate.
2) methyl – 3 – formyl – 3 – ethyl 5 – hexynoate.
3) methyl 2 – ethyl – 2 – formyl – 4 – pentynoate
4) 2 – ethyl – 2 methyloxycarbonyl – 4 – pentynal
5) methyl – 2 – ethyl – 2 – formyl – 4 – pentynoate

8) HCOOH හා $CH_3COOH$ යන කාබොක්සිලික් අම්ල 2 ක එකිනෙකින් වෙන්කර හඳුනා ගැනීම සඳහා භාවිතා කළහැකි ප්‍රතිකාරක වන්නේ,

1) උදාසීන $FeCl_2$ ද්‍රාවණයක් 2) ටොලන් ප්‍රතිකාරය 3) $Br_2$දියර
4) ජලීය NaOH ද්‍රාවණයක් 5) ජලීය $Na_2CO_3$ ද්‍රාවණයක්

9) ඝනත්වය 0.09 $gcm^{-3}$ වන 36.5 % HCl 25.00 $cm^3$ ද්‍රාවණයක් සමඟ $Ba(OH)_2$ ද්‍රාවණ 50.00 $cm^3$ ප්‍රතික්‍රියා කළ විට ලැබෙන ද්‍රාවණයේ $H^+$ සාන්ද්‍රණය 0.02 $moldm^{-3}$ වේ. යොදාගත් $Ba(OH)_2$ ද්‍රාවණයේ සාන්ද්‍රණය වන්නේ,(Cl= 35.5, H=1)

1) 0.75 $moldm^{-3}$ 2) 0.21 $moldm^{-3}$ 3) 0.32 $moldm^{-3}$
4) 0.58 $moldm^{-3}$ 5) 0.42 $moldm^{-3}$

10) $25^0$ C දී pH අගය 7 ට වඩා වැඩි වන්නේ පහත දැක්වෙන කවර ජලීය ද්‍රාවණයේදීද ?

1) $NH_4I$ 2) $CH_3COONH_4$ 3) $CCl_3COONH_4$ 4) $C_6H_5ONa$ 5) $NH_4NO_3$

11) දෘඪ සංවෘත භාජනයක එක්තරා උෂ්ණත්වයක දී පහත සමතුලිතතාව ඇති වේ.

$$A(s) + 2B(g) \rightleftharpoons 2C(g)$$

මෙම පද්ධතියේ සමතුලිතතා නියතය 100 කි. වෙනත් අවස්ථාවකදී එම භාජනය තුලම එම උෂ්ණත්වයේදීම පහත සමතුලිතතාව ඇති වීමට සලස්වන ලදී.

$$2C(g) \rightleftharpoons A(s) + 2B(g)$$

මේ සඳහා ආරම්භයේ දී C(g) මවුල 1 ක් භාවිතා කළේ නම් , නව සමතුලිතතාව ඇති වීමේ දී C හි විඝටන ප්‍රතිශතය කොපමණද ?

1) 1.35% 2) 4.50% 3) 13.5% 4) 29.20% 5) 45.4%

12) $FeC_2O_4$ 0.72g ක් තනුක $H_2SO_4$ තුල සම්පූර්ණයෙන්ම ද්‍රවණය කිරීමෙන් අනතුරුව $70^0C$ දක්වා රත් කරන ලදී. අනතුරුව ද්‍රාවණය 0.30 $moldm^{-3}$ $KMnO_4$ ද්‍රාවණයක් සමඟ අනුමාපනය කරන ලදී. අන්ත ලක්ෂයේ දී වැය වූ $KMnO_4$ පරිමාව කොපමණද ?

( C = 12, O = 16, Fe = 56 )

1) 3.33 $cm^3$ 2) 8.00 $cm^3$ 3) 10.00 $cm^3$ 4) 12.40 $cm^3$ 5) 16.50 $cm^3$



Scanned by CamScanner

13) $(CH_3)_2C = O(g)$ + HCN (g) $\longrightarrow$ $(CH_3)_2\overset{OH}{\overset{|}{C}}CN(g)$යන ප්‍රතික්‍රියාවට අදාල සම්මත එන්තැල්පි විපර්යාසය kJ $mol^{-1}$ වලින් වනුයේ

| බන්ධනය | සම්මත මධ්‍ය බන්ධන එන්තැල්පිය අගය /$kJmol^{-1}$ |
|---|---|
| C = O | 743 |
| C – H | 412 |
| C – O | 360 |
| C – C | 348 |
| H – O | 463 |

1) +1155  2) +16  3) - 16  4) +2326  5) - 2326

14) X සත අකාබනික සංයෝගය ජලයේ ද්‍රාව්‍යය වේ. X රත් කළ විට වියෝජනය වී සහසංයුජ සංයෝග පමණක් සාදයි. X මින් කුමක් විය හැකිද ?

1) $(NH_4)_2Cr_2O_4$  2) $Mg(NO_3)_2$  3) $(NH_4)_2CO_3$  4) $AgNO_3$  5) $LiNO_3$

15) පරිමාව 4.157 $dm^3$වන දෘඪ සංවෘත බඳුනක් තුළ ආරම්භයේදී A(g) හි 0.45 mol තබන ලදී. 327 °C රත් කළ විට පහත ආකාරයට ප්‍රතික්‍රියාව සිදු වේ.

$$A(g) \longrightarrow 2B(g)$$

A(g) සම්පූර්ණයෙන්ම B(g) බවට පත් නොවූ අතර 327 °C හි දී පද්ධතියේ සමස්ත පීඩනය $9 \times 10^5$ $Nm^{-2}$විය. එවිට ඉතිරිව ඇති A(g) හි මවුල ප්‍රමාණය වන්නේ (A(g)හා B(g)පරිපූර්ණ ලෙස හැසිරේ. )

1) 0.30  2) 0.15  3) 0.20  4) 0.05  5) 0.01

16) A නම් සංයෝගය $CH_3CHO$ හා තනුක NaOH සමග උණුසුම් කර ලැබෙන ඵලය $H^+/KMnO_4$මගින් ඇරෝමැටික කාබොක්සිලික් අම්ල කාණ්ඩ 2ක් පමණක් සහිත සංයෝගයක් බවට පත් වේ. A විය හැක්කේ,

1) 


2) 


3) 


4) 


5) 


alsciencepapers .blogspot.com



Scanned by CamScanner

17) පහත ක්‍රියාවලින්හි නිවැරදි ප්‍රතික්‍රියාව කුමක්ද ?

1) 

2) 

3) 

4) 

5) 

18) පහත සඳහන් ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතාවයට අදාලව දක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

$A(g) + 3\,B(g) \rightarrow 2\,D(g)$

1) ශීඝ්‍රතාව $= -\frac{\Delta C_A}{\Delta t} = -\frac{1}{3}\frac{\Delta C_B}{\Delta t} = \frac{1}{2}\frac{\Delta C_D}{\Delta t}$

2) ශීඝ්‍රතාව $\propto [A]\,[B]^3$

3) B හි සාන්ද්‍රණය වැඩි කළ විට ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතාවය ඉතා වේගයෙන් වේ.

4) ප්‍රතික්‍රියාව සිදු වන විට පද්ධතියේ එන්ට්‍රොපිය ධනඅගයක් ගනී.

5) ප්‍රතික්‍රියාව පියවර ගණනාවකින් සිදු වී D සාදයි.

alsciencepapers.blogspot.com

19) පහත වගන්ති අතරින් කවරක් සත්‍යය වේද ?

1) වායුගෝලීය $NO_2(g)$, $NO_3^-(g)$ බවට ඔක්සිකරණය වීමේ ශීඝ්‍රතාවය NO මගින් වැඩි කරයි.

2) $NO_x(g)$ වලින් වැඩිමනක් ප්‍රමාණයක් වායුගෝලයට ඇතුළු වන්නේ අභ්‍යන්තර දහන එන්ජින් වලිනි.

3) වාෂ්පශීලී හේලොහයිඩ්‍රොකාබන වායුගෝලීය සංයුතිය වෙනස් කිරීමට බලපෑමක් ඇති නොකරයි.

4) ගෝලීය උණුසුම් වීමේ ප්‍රධානතම ප්‍රභේදය $NO_x(g)$ වේ.

5) $NO_x(g)$ හා නොදැවුන හයිඩ්‍රොකාබන හිරු එළිය හා 15°C ට පහළ උෂ්ණත්වය යන සාධක ප්‍රකාශ රසායනික ධූමිකාවට අත්‍යවශ්‍යය.

20) ජලීය ද්‍රාවණයක $NH_3(aq)$ සාන්ද්‍රණය 0.02 mol dm$^{-3}$ හා KOH සාන්ද්‍රණය 0.01mol dm$^{-3}$ වේ. ද්‍රාවණයේ ඇති $NH_4^+$ සාන්ද්‍රණය mol dm$^{-3}$ වලින් කොපමණද ?

$NH_3$ හි $K_b = 5 \times 10^{-5}$moldm$^{-3}$

1) $2.5 \times 10^{-5}$ 2) $1.0 \times 10^{-4}$ 3) $7 \times 10^{-4}$ 4) $1.0 \times 10^{-3}$ 5) 0.01

21) පරිපූර්ණ වායුවක් වන $X_3$ හි වර්ග මධ්‍යන්‍ය මූල ප්‍රවේගය 27°Cහිදී කොපමණ වේද ? (X = 10)

1) 725 2) 499 3) 455 4) 704 5) 575



Scanned by CamScanner

22) X හා Y යන සංයෝගය පිළිබඳ ව පහත ප්‍රකාශ සලකන්න.

| X | Y |
|---|---|
| තනුක HCl හි ද්‍රාව්‍යය වේ | තනුක HCl හි ද්‍රාව්‍යය වේ |
| තනුක NaOH ද්‍රාව්‍යය නොවේ | තනුක NaOH ද්‍රාව්‍යය වේ |
| $NaNO_2$ /HCl සමඟ අවර්ණ වායු පිටකරයි | $NaNO_2$ /HCl අවර්ණ වායු පිටකරයි |

අනුපිළිවෙලින්X හා Y වීමට වඩාත්ම ඉඩ ඇත්තේ

1) 

2) 

3) $CH_3CH_2OH$ $CH_3CH_2COOH$

4) 

5) 

23) $H-\overset{H}{\overset{|}{C}}=\overset{H}{\overset{|}{C}}-CH_2C\equiv CH$ යන සංයෝගයේ 1 mol ක් HBr 1 mol ක් සමඟ ප්‍රතික්‍රියා කළ විට ලැබෙන ප්‍රධාන ඵලය වන්නේ,

1) $CH_3\underset{Br}{\underset{|}{C}}H-CH_2-C\equiv CH$

2) $Br\,CH_2-CH_2-CH_2-C\equiv C-H$

3) $H_2C=CH-CH_2-\overset{Br}{\overset{|}{C}}=CH_2$

4) $H_2C=CH-CH_2-CH=CHBr$

5) $H_2C=CH-CH_2-\underset{Br}{\underset{|}{\overset{Br}{\overset{|}{C}}}}-CH_3$

24)




$E^{\theta}_{Co^{2+}/Co} = -0.28V$

$E^{\theta}_{Al^{3+}/Al} = -1.66V$

ඉහත සටහනේ දැක්වෙන විද්‍යුත් රසායනික කෝෂයෙහි පරිපථය සම්පූර්ණ කළ විට, කාලය t(s) වන අවස්ථාවක දී ඇනෝඩ කුටීරය තුල ඇති ලෝහ අයන සාන්ද්‍රණය $1.01 mol dm^{-3}$ බව සොයාගන්නා ලදි. එම අවස්ථාවේ දී කැතෝඩ කුටීරයේ ලෝහ අයන සාන්ද්‍රණය ($mol dm^{-3}$)කොපමණද ?
( කෝෂය ක්‍රියාත්මක වන විට පරිමා වෙනසක් සිදු නොවේ )

1) 0.08 2) 0.10 3) 0.97 4) 1.03 5) 1.97

25) පරමාණුක ක්‍රමාංකය 25 වන මූල ද්‍රව්‍යයේ භූමි අවස්ථාවේ ඇති වියුග්ම ඉලෙක්ට්‍රෝනයක් සඳහා පැවතිය නොහැකි ක්වොන්ටම් අංක කුලකය වන්නේ

1) $3, 2, -1, +\frac{1}{2}$ 2) $3, 2, 0, +\frac{1}{2}$ 3) $3, 0, 0, +\frac{1}{2}$

4) $3, 2, -2, +\frac{1}{2}$ 5) $3, 2, +1, +\frac{1}{2}$



Scanned by CamScanner

26) A = $CH_3NH_2$ B = $CH_3CH_2NH_2$ C =  D =  E = 

ඉහත ප්‍රභේදයන් ගේ භාෂ්මිකතාව ආරෝහණය වන නිවැරදි පිළිවෙල වන්නේ ?

1) D < E < C < A < B  2) D< E < C < B <A  3) E < D < C < A < B
4) D <C < E < B <A  5) C < E < D < A < B

27) X නමැති කාබනික සංයෝගය එතනෝල් සහ සාන්ද්‍ර $H_2SO_4$ බිංදු කිහිපයක් සමග රත්කළ විට ප්‍රසන්න සුවඳක් ගෙනදේ. තවද X, $Br_2(aq)$ දියර අවර්ණ කරයි. X ජ්‍යාමිතික සමාවයවිකතාව දක්වයි. X විය හැක්කේ කුමක්ද ?

1) 
2) 
3) 
4) 
5) $CH_3CH = CHCH_2CHO$

28) සාන්ද්‍රණය 0.01mol $dm^{-3}$ වන ඒක භාෂ්මික දුබල අම්ලයකින් 25.00$cm^{-3}$ ක් සාන්ද්‍රණය 0.01 mol $dm^{-3}$ වන ඒක ආම්ලික ප්‍රබල භෂ්මයක් සමග අනුමාපනය කරන ලදි. අනුමාපනයේ සමකතා ලක්ෂය හදුනා ගැනීම සඳහා වඩාත්ම සුදුසු දර්ශකය පහත දර්ශක අතුරින් කුමක්ද ?

ඒක භාෂ්මික දුබල අම්ලයේ, $Ka = 5 \times 10^{-5}$ $moldm^{-3}$

| දර්ශකය | PKIn |
|---|---|
| A | 4.75 |
| B | 7.0 |
| C | 8.15 |
| D | 11.2 |
| E | 12.8 |

1) A  2) B  3) C  4) D  5) E

29) $25^0C$ දී pH = 8 වන ජලීය ද්‍රාවණයක දී $Fe(OH)_3$ හි ද්‍රාව්‍යතාවය $moldm^{-3}$ වලින් කොපමණද ?
$Fe(OH)_3$ හි $K_{SP} = 1 \times 10^{-36}$ $mol^3dm^{-9}$

1) $1\times 10^{-24}$  2) $1\times 10^{-18}$  3) $1\times 10^{-12}$  4) $4.3 \times 10^{-10}$  5) $3 \times 10^{-6}$

30) $Pt(s) \mid Cl_{2\,(g,\ 1\ atm)} \mid Cl^-_{(aq\ 1.00\ mol\ dm^{-3})}$ හා $M(s) \mid M^{2+}_{(aq,\ 1.00\ moldm^{-3})}$ යන ඉලෙක්ට්‍රෝඩ භාවිතයෙන් විද්‍යුත් රසායනික කෝෂයක් ගොඩනගන ලදි. ක්ලෝරීන් වායු ඉලෙක්ට්‍රෝඩය ධන අග්‍රය ලෙස ක්‍රියා කරන ලදි. එම කෝෂයේ විද්‍යුත් ගාමක බලය 2.13 V ක් විය.

$Pt(s) \mid Cl_2(g) \mid Cl^-(aq) = 1.36$ V නම් මෙම කෝෂය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශ/ප්‍රකාශයක් සත්‍යය වේද ?

a) $M(s) \mid M^{2+}(aq)$ඉලෙක්ට්‍රෝඩයේ සම්මත ඉලෙක්ට්‍රෝඩ විභව – 0.77 V වේ.
b) ක්ලෝරීන් වායුවේ ආංශික පීඩනය වැඩි කළහොත් කෝෂයේ විද්‍යුත් ගාමක බලය වැඩි වේ.
c) ද්‍රාවණයේ $Cl^-(aq)$ සාන්ද්‍රණය දෙගුණ කළ හොත් කෝෂයේ විද්‍යුත් ගාමක බලය අඩු වේ.

1) a පමණි  2) a, b පමණි  3) a, b, c පමණි  4) b, c පමණි  5) a, c පමණි



Scanned by CamScanner

- **අංක31සිට40දක්වා ප්‍රශ්න වලට උපදෙස්**

අංක31සිට40තෙක් වූ එක් එක් ප්‍රශ්නයේ දක්වා ඇති(a), (b), (c)හා (d)යන ප්‍රතිචාර හතර අතරෙන් එකක් හෝ වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය / ප්‍රතිචාර කවරේදැයි තෝරා ගන්න.

(a)හා(b)පමණක් නිවැරදි නම්(1)මත ද
(b) හා(c)පමණක් නිවැරදි නම්(2)මත ද
(c)හා(d)පමණක් නිවැරදි නම්(3)මත ද
(d) හා(a)පමණක් නිවැරදි නම්(4) මත ද
වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදියි නම් (5) මත ද

උත්තර පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි සළකුණු කරන්න.

alsciencepapers .blogspot.com

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) |
| (a) සහ (b) පමණක් නිවැරදියි | (b) සහ (c) පමණක් නිවැරදියි | (c) සහ (d) පමණක් නිවැරදියි | (d) සහ (a) පමණක් නිවැරදියි | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදියි |

31) අයන වල ධ්‍රැවීකරණය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය / ප්‍රකාශ අසත්‍යයද ?

a) ඇනායන විශාල වන විට අයනික ලක්ෂණ පෙන්නුම් කරන අතර ධ්‍රැවනශීලීතාව වැඩි වේ.

b) ඉහළ ආරෝපණයකින් යුතු කුඩා කැටායන වල ධ්‍රැවීකරණ බලය වැඩිය.

c) ධ්‍රැවීකරණයෙන් ඇති වන බලපෑම නොසලකා හැරිය හැකි තරම් කුඩා නම් බන්ධනය අයනික ස්වභාවයෙන් පවතී.

d) කැටායනයේ අරය විශාල වන විට එහි ධ්‍රැවනශීලීතාව වැඩි වේ..

32) සංවෘත දෘඪ භාජනයක සිදුවන පහත සමතුලිත ප්‍රතික්‍රියාව සලකන්න.

$$2C\,(s) + O_2(g) \rightleftharpoons 2\,CO(g) \qquad \Delta H\,(-)$$

පහත කුමන ක්‍රම/ ක්‍රමය මගින් $CO(g)$ හි ඵලදාව වැඩිකර ගත හැකිවේ ද?

a) සමතුලිත පද්ධතියට $C_{(s)}$ එකතු කිරීමෙන්

b) $O_2(g)$ හි ආංශික පීඩනය වැඩි කිරීමෙන්

c) නියත පීඩනයක් යටතේ පද්ධතියේ උෂ්ණත්වය අඩු කිරීමෙන්

d) නියත උෂ්ණත්වයක් යටතේ පීඩනය වැඩි කිරීමෙන්

33) හේබර් ක්‍රමයෙන් ඇමෝනියා නිපදවීම සම්බන්ධව පහත කුමන ප්‍රකාශ/ ප්‍රකාශය සත්‍යය ද?

$$N_2(g) + 3H_2(g) \rightleftharpoons 2NH_3(g) \qquad \Delta H = -92\ kJ\ mol^{-1}$$

a) පීඩනය වැඩිකළ විට සමතුලිත ලක්ෂය දකුණට යොමු වන බැවින් කාර්මිකව ඉහළ පීඩනයක්යෙදේ.

b) පහළ උෂ්ණත්වවල දී සමතුලිත ලක්ෂය දකුණට යොමු වන බැවින් කාර්මිකව පහළ උෂ්ණත්ව යෙදේ.

c) ඉහළඋෂ්ණත්වවල දී මෙය සිදු කරනු ලබන්නේ යකඩ උත්ප්‍රේරක හමුවේදී ය.

d) සෑදෙන ඇමෝනියා ද්‍රවකොට ඉවත්කිරීමෙන්සමතුලිත ලක්ෂය ඉදිරියට යොමු වේ.

34) ජලීය $NH_4Cl$ ද්‍රාවණයක් බිංදු වශයෙන් එක් කිරීමේදී අවක්ෂේපයක් දැකිය හැක්කේ පහත කුමන ද්‍රාවනයේ ද?

a) $Na_2ZnO_2$ද්‍රාවණය

b) $NaAlO_2$ද්‍රාවණය

c) $Ba(OH)_2$ ද්‍රාවණය

d) $Na_2S_2O_3$ ද්‍රාවණය



Scanned by CamScanner

35) $A_2(g)$ + $3B_2(g)$ ⟶ $2AB_3(g)$ යන ප්‍රතික්‍රියාවේ 298 K දී තාපගතිකව ස්වයංසිද්ධ වන නමුදු එය ඉහළ උෂ්ණත්වවලදී එසේ නොවේ. 298 K හි දී ප්‍රතික්‍රියාව සම්බන්ධයෙන් කුමක් සත්‍ය වේද?

a) $\Delta G$ සහ $\Delta H$ ධන වේ.

b) $\Delta G$ සහ $\Delta H$ සෘණ වේ.

c) $\Delta S$ සෘණවේ.

d) $\Delta S$ ධන හෝ සෘණ විය හැකියි.

36) බහු අවයවක සම්බන්ධයෙන් සත්‍ය වනුයේ

a) ටෙරිලීන් තාප සුවිකාර්ය ආකලන බහුඅවයවයකි.

b) රබර් ස්වාභාවික අසංතෘප්ත සංඝනන බහුඅවයවයකි.

c) බේක්ලයිට් තාපස්ථාපන ත්‍රිමාන බහුඅවයවයකි.

d)ටෙෆ්ලෝන් කෘත්‍රිම ආකලන බහුඅවයවයකි.

37) අසත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ තෝරන්න.

a) බහු පියවර ප්‍රතික්‍රියාවල වේගවත්ම පියවරට ඉහළම සක්‍රියන ශක්තියක් පවතී.

b) යම් ප්‍රතික්‍රියාවක සක්‍රියන ශක්තිය අඩු නම්, පහළ උෂ්ණත්වයක දී වුව ද විශාල අණු සංඛ්‍යාවක අදාළ සක්‍රියන ශක්තිය ඉක්මවා යයි.

c) උත්ප්‍රේරකයක් මගින් යම් ප්‍රතික්‍රියාවක සක්‍රියන ශක්තිය අඩු කරන නිසා එම සක්‍රියන ශක්තිය ඉක්මවා යා හැකි අණු සංඛ්‍යාව විශාල වේ.

d) වායුමය ප්‍රතික්‍රියකයක ආංශික පීඩනය වැඩිවන විට අණු අතර දුර වැඩිවී සිදුවන සංඝට්ටන සංඛ්‍යාව ඉහළ යයි.

38) මෙතිල් ඇමීන් හා ඇනිලීන් පිළිබඳ පහත සඳහන් කුමන ප්‍රකාශ / ප්‍රකාශය සත්‍ය වේ ද?

a) මෙතිල් ඇමීන්, ඇනිලීන් වලට වඩා ප්‍රබල භෂ්මයක් බැවින්, මෙතිල් ඇමීන් හි $K_b$අගය ඇනිලීන්හි $K_b$අගයට වඩා විශාල වේ.

b) ඇනිලීන්වල පෙනිල් කාණ්ඩයේ π - ඉලෙක්ට්‍රෝන සමග, නයිට්‍රජන් පරමාණුවේ එකසර ඉලෙක්ට්‍රෝන යුගල අතිච්ඡාදනය වන නිසා, මෙතිල් ඇමීන් වලට වඩා ඇනිලීන් ප්‍රබල භෂ්මයකි.

c) මෙතිල් ඇමීන් ප්‍රාථමික ඇමීනයක් ද, ඇනිලීන් ද්විතියික ඇමීනයක් ද බැවින්, මෙතිල් ඇමීන් වලට වඩා ඇනිලීන් ප්‍රබල භෂ්මයකි.

d) N පරමාණුවේ එකසර ඉලෙක්ට්‍රෝන යුගලයක් ඇති නිසා, මෙතිල් ඇමීන් සහ ඇනිලීන් යන දෙකටම නියුක්ලියෝෆයිල ලෙස ක්‍රියා කළ හැක.

39) ප්‍රබල අම්ලයක් හෝ භෂ්මයක් එක් කළ විට වායුවක් මුක්ත වන්නේ පහත ඒවා අතුරින් කුමකින් ද?

a) $(NH_4)_2Cr_2O_7$ b) $Ba(NO_2)_2$ c) $Li_2SO_4$ d) $FeSO_4$

40) සර්වසම වීදුරු-බුබුළු දෙකකින් එකක පරිපූර්ණ වායුවක් ද, අනෙකේ තාත්වික වායුවක් ද සමමවුල ප්‍රමාණය බැගින් පිරී ඇත.මෙම වායු පිළිබඳ අසත්‍ය ප්‍රකාශ / ය වන්නේ,

a) වායු දෙකෙහිම සම්පීඩ්‍යතාවයන් යම් උෂ්ණත්වයකදී සම විය හැක.

b) ඉහළ උෂ්ණත්ව හා පහළ පීඩන පරාසවල දී වායු දෙකෙහි පීඩන යම් උෂ්ණත්වයක දී සම විය හැක.

c) ඕනෑම උෂ්ණත්වයක දී වායු දෙකෙහි වර්ග මධ්‍යන්‍යය වේග සමාන වේ.

d) එකම උෂ්ණත්වයක දී පරිපූර්ණ වායුවේ පීඩනය තාත්වික වායුවේ පීඩනයට වඩා කිසිවිටෙක අඩුවිය නොහැකිය.

- අංක41සිට 50 දක්වා ප්‍රශ්න වලට උපදෙස්



Scanned by CamScanner

අංක 41 සිට50 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා ප්‍රකාශ දෙක බැගින් ඉදිරිපත් කර ඇත. එම ප්‍රකාශ යුගලයට **හොඳින්** ම ගැලපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන (1), (2), (3), (4) ,(5) යන ප්‍රතිචාර වලින් කවර ප්‍රතිචාරය දැයි තෝරා උත්තර පත්‍රයේ උචිත ලෙස ලකුණු කරන්න.

| ප්‍රතිචාර | පළමු වගන්තිය | දෙවන වගන්තිය |
|---|---|---|
| 1 | සත්‍යයි. | සත්‍ය වන අතර පළමුවැන්න නිවැරදිව පහදා දෙයි |
| 2 | සත්‍යයි. | සත්‍ය වන අතර පළමුවැන්න නිවැරදිව පහදා නොදෙයි. |
| 3 | සත්‍යයි. | අසත්‍යයි. |
| 4 | අසත්‍යයි. | සත්‍යයි. |
| 5 | අසත්‍යයි. | අසත්‍යයි. |

alsciencepapers .blogspot.com

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 41) | $Hg_2Cl_2(s) + 2Ag(s) \longrightarrow 2AgCl(s) + 2Hg(l)$ යන කෝෂයෙන් 0.1 A ක ධාරාවක් විනාඩි 60 ක කාලයක් තුළදී ලබාගත් විට $Ag(s)$ + $AgCl(s)$ ස්කන්ධයේ වූ වෙනස 0.132 g කි.(Cl = 35.5) | විද්‍යුත් විච්ඡේද්‍යයක් තුළින් 1 C ක විද්‍යුත් ප්‍රමාණයක් ගලාගිය විට ඉලෙක්ට්‍රෝඩ මත තැන්පත් වන හෝ ඉලෙක්ට්‍රෝඩ මගින් නිදහස් වන ද්‍රව්‍ය ස්කන්ධය අදාළ ද්‍රව්‍යයේ රසායනික සමකයයි. |
| 42) | 100 °C පවතින සංශුද්ධ ජලයට 100 °C ට රත් කළ$NaCl(s)$ එකතු කළ විට ජලය නැටීම ක්ෂණිකව නවතී. | $NaCl(s)$ හි තාපාංකය ජලීය $NaCl(aq)$ ද්‍රාවණයක තාපාංකයට වඩා වැඩිවේ. |
| 43) | සල්ෆියුරික් අම්ල නිෂ්පාදනයේ දී $SO_2$ වායුව ඔක්සිකරණය කාර්යක්ෂමව සිදුකර ගැනීමට ඉහළ පීඩන යොදා ගනී. | $2SO_2 + O_2 \rightleftharpoons 2SO_3$ පීඩන වැඩිකළ විට ලේවැටලියර් මූලධර්මය මගින් අණු ගණන අඩු දිශාවට ප්‍රතික්‍රියාව සිදුවේ. |
| 44) | උෂ්ණත්වය15°C ට අඩුවන විට හා සූර්යාලෝකය ඇතිවිට $NO_X$හා නොදැවුන හයිඩ්‍රොකාබන සහිත පරිසරයක පවතින කෘත්‍රිම රෙදිවල ගුණාත්මක බව අඩුවේ . | ප්‍රකාශ රසායනික ධූමිකාව නිසා π බන්ධන විඛණ්ඩනයට ලක්වේ. |
| 45) | Ag වල අවසාන ශක්ති මට්ටමේ ඉලෙක්ට්‍රෝනයකඋද්දිගංශ ක්වොන්ටම් අංකය හා Cu වල අවසාන ශක්ති මට්ටමේ ඉලෙක්ට්‍රෝනයකඋද්දිගංශ ක්වොන්ටම් අංකය එකිනෙකින් වෙනස් වේ. | Cu වලට වඩා Ag ආවර්තිතා වගුවේ පහළ ආවර්තයක පිහිටයි. |
| 46) | $NH_4OH$ ද්‍රාවණයක් භාවිතා කර $Zn^{2+}$ද්‍රාවණයක් හා ජලීය $Cd^{2+}$ ද්‍රාවණයක් වෙන් කොට හඳුනාගත නොහැකිය. | $Zn^{2+}$හා $Ca^{2+}$යන දෙකම $NH_4OH$ අවක්ෂේප සාදන අතර ඒවා වැඩිපුර ප්‍රතිකාරකයේ දියවේ. |
| 47) | $NH_3$ හි සංයුග්මක භෂ්මය $NH_2^-$ වේ. | $NH_2^-$ මත ඇති එකසර ඉලෙක්ට්‍රෝන යුගල, ඉලෙක්ට්‍රෝන ඌන ප්‍රභේදයකට දායක කළ හැක. |
| 48) | $CH_3CH = CH_2$වලට HBr ආකලනය වීමෙන් $CH_3CHBrCH_3$සෑදේ. | -C = C-වලට HBr ආකලනය වන්නේ ඉලෙක්ට්‍රෝන ඝනත්වය ඉහළ වන කාබන් පරමාණුවට $H^+$ විසින් පහර දීම ඔස්සේ ය. |
| 49) | $CH_3$–  –COOH, $CH_3COOH$වලට වඩා දුබල භෂ්මයකි. | බෙන්සීන් වලට සම්බන්ධ වී ඇති – $CH_3$ කාණ්ඩයට ඉලෙක්ට්‍රෝන ආකර්ෂණය කර ගැනීමේ හැකියාව තිබේ. |
| 50) | මූලික පියවර දෙකකින් සිදුවන ප්‍රතික්‍රියාවක අතරමැදි ප්‍රභේදයේ ශක්තිය සැමවිටම සක්‍රිය සංකීර්ණයේ ශක්තියට වඩා අඩුය. | ප්‍රතික්‍රියාවක,ප්‍රතික්‍රියක අණු හිතකර දිශානතියෙන් සංඝට්ටනය වී සක්‍රිය සංකීර්ණය සාදා, එය ඉක්මනින් බිඳී අතර මැදි ඵල හෝ ප්‍රධාන ඵල සාදයි. |



Scanned by CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved]

කොළ/විශාකා විද්‍යාලය කොළඹ - 05

Co/ Visakha Vidyalaya Colombo - 05

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 ජූනි

General Certificate of Education (Adv. Level) Examination, June 2018

| රසායන විද්‍යාව II<br>Chemistry II | 02 S II | පැය තුනයි<br>Three hours |
|---|---|---|

13- ශ්‍රේණිය, ,Grade -13 | අවසාන වාර විභාගය Final Term Test .

* ආවර්තිතා වගුවක් සපයා ඇත.
* ගණක යන්ත්‍ර භාවිතයට ඉඩදෙනු නොලැබේ.

නම

:.........................................................................

* සාර්වත්‍ර වායු නියතය $R = 8.314\ J\ mol^{-1}K^{-1}$
* ඇවගාඩ්‍රෝ නියතය $N_A = 6.022 \times 10^{23}\ mol^{-1}$
* ප්ලාන්ක්ගේ නියතය $h = 6.626 \times 10^{-34}\ J\ s$
* ආලෝකයේ ප්‍රවේගය $c = 3 \times 10^{8}\ m\ s^{-1}$

* මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී ඇල්කයිල් කාණ්ඩ සංක්ෂිප්ත ආකාරයකින් නිරූපණය කළ හැකිය.

උදාහරණ:  කාණ්ඩය $CH_3CH_2$— ලෙස දැක්විය හැකි ය.

□ A කොටස — ව්‍යුහගත රචනා (පිටු 2 – 08)

* සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න
* ඔබේ උත්තර එක් එක් ප්‍රශ්නයට පහළින් ඉඩ සලසා ඇති තැන්වල ලිවියයුතු ය. මේ ඉඩ ප්‍රමාණය උත්තර ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බව ද සලකන්න.

□ B කොටස සහ C කොටස — රචනා (පිටු 09 – 14)

* එක් එක් කොටසින් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරා ගනිමින් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි භාවිත කරන්න.
* සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන්වූපසු A, B සහ C කොටස්වලට පිළිතුරු, A කොටස මුලින් තිබෙන පරිදි එක් පිළිතුරු පත්‍රයක් වනසේ අමුණා, විභාග ශාලාධිපතිට භාරදෙන්න.
* ප්‍රශ්න පත්‍රයෙහි B සහ C කොටස් පමණක් ශාලාවෙන් පිටතට ගෙනයාහැකි ය.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| කොටස | ප්‍රශ්න අංක | ලැබූ ලකුණු |
|---|---|---|
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| C | 8 | |
| | 9 | |
| | 10 | |
| එකතුව | | |
| ප්‍රතිශතය | | |

අවසාන ලකුණු

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

සංකේත අංක

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| පරීක්ෂා කළේ | |
| අධීක්ෂණය කළේ | |



Scanned by CamScanner

1. A) අස්ථායී සංයෝගයක් වන පෙරොක්සො මොනොසල්ෆියුරික් අම්ලයේ සැකිල්ල පහත දක්වා ඇත. (i) සිට (iv) දක්වා වූ ප්‍රශ්න පහත අම්ලය මත පදනම් වී ඇත.



i) මෙම අණුව සඳහා වඩාත්ම පිළිගත හැකි ලුවිස් ව්‍යුහය අඳින්න.

ii) මෙම අණුව සඳහා (ඉහත i හි අඳින ලද ව්‍යුහය හැර) සම්ප්‍රයුක්ත ව්‍යුහ 04 ක් අඳින්න.

iii) පහත දක්වෙන කල්පිත ලුවිස් ව්‍යුහය පදනම් කරගෙන වගුවේ දක්වා ඇති C, N, O පරමාණු වල

I. පරමාණුව වටා VSEPR යුගල්

II. පරමාණුව වටා ඉලෙක්ට්‍රෝන යුගල ජ්‍යාමිතිය

III. පරමාණුව වටා හැඩය

IV. පරමාණුවේ මුහුම්කරණය සඳහන් කරන්න.



පහත දක්වෙන පරිදි පරමාණු අංකනය කර ඇත.



| | $N^2$ | $C^3$ | $O^4$ | $C^5$ |
|---|---|---|---|---|
| VSEPR යුගල් | | | | |
| ඉලෙක්ට්‍රෝන යුගල් ජ්‍යාමිතිය | | | | |
| හැඩය | | | | |
| මුහුම්කරණය | | | | |



Scanned by CamScanner

(iv) ඉහත (iii) කොටසෙහි දෙන ලද ලුවිස් ව්‍යුහයෙහි පහත සඳහන් σ බන්ධන සෑදීමට සහභාගී වන පරමාණුක/ මුහුම් කාක්ෂික හඳුනාගන්න.

I. $N^2 - C^1$ $N^2$ ......... $C^1$ .........

II. $O^4 - C^3$ $O^4$ ......... $C^3$ .........

III. $C^1 - O^7$ $C^1$ ......... $O^7$ .........

IV. $C^3 - H^6$ $C^3$ ......... $H^6$ .........

(ලකුණු 5.0)

B) i) පරමාණුක ක්‍රමාංකය 42 වන M නමැති මූලද්‍රව්‍යයේ ඉලෙක්ට්‍රෝන වින්‍යාසය ලියා දක්වන්න.

.............................................................................................................................................

ii) ඉහත M සඳහා $M^{3+}$ අයනයේ අඩංගු යුගල නොවූ ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාව කොපමණද?

.............................................................................................................................................

iii) එම යුගල නොවූ ඉලෙක්ට්‍රෝන වලට තිබිය හැකි ක්වොන්ටම් අංක කුලක ලියා දක්වන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

iv) පහත සඳහන් අවස්ථා වල පවතින අන්තර් අණුක බල වර්ගය/වර්ග සඳහන් කරන්න.

I ජලීය $CH_3CHO$ ද්‍රාවණයක.............................................................................................

II ජලීය KI තුළ ද්‍රවණය කරන ලද $I_2$ ද්‍රාවණයක.......................................................................

III ජලීය $Cl_2$ ද්‍රාවණයක ...................................................................................................

v) වරහන් තුළ ඇති ගුණය අඩුවන පිළිවෙලට පහත සඳහන් දෑ සකසන්න.

I $XeF_4$, $NF_3$, $NH_3$, $CF_4$ (බන්ධන කෝණය).................................................................

II HF, HCl, HBr, HI (ආම්ලික ප්‍රබලතාව) ................................................................................

III $NH_3$, $NH_2OH$, $NH_4^+$, $NH_2^-$ (නයිට්‍රජන් වල විද්‍යුත් සෘණතාව)........................................

(ලකුණු 3.0)

c) එතිල් මර්කැප්ටන් ($CH_3CH_2SH$) වායුවක් වන අතර එතිල් මධ්‍යසාර ($C_2H_5OH$) වාෂ්පශීලි ද්‍රවයකි.

i) වඩා විශාල ද්විධ්‍රැව ඝූර්ණයක් ඇත්තේ ඉහත කුමන ද්‍රව්‍යයට ද? .............................................

ii) වඩා වැඩියෙන් ජලයේ ද්‍රාව්‍ය වන්නේ කුමන ද්‍රව්‍යයද? ...........................................................

iii) වඩා ප්‍රබල ලන්ඩන් අපකිරණ බල ඇත්තේ කුමන ද්‍රව්‍යයට ද?...............................................

iv) වඩා ප්‍රබල මුළු අන්තර් අණුක බල ඇත්තේ කුමන ද්‍රව්‍යයට ද?.............................................

v) ඉහත ද්‍රව්‍ය දෙක සැලකීමේ දී වඩා ප්‍රමුඛ වන අන්තර් අණුක බල වර්ගය කුමක් ද?........................

(ලකුණු 2.0)

Scanned by CamScanner

2. a) X, Y, Z නම් අනුයාත මූලද්‍රව්‍ය 03 ක් අතරින් Y හි ප්‍රථම අයනීකරණ ශක්ති අට පිළිවෙලින් $KJmol^{-1}$ වලින් පහත දක්වා ඇත.

1310, 3390, 5320, 7450, 11000, 13300, 71000, 84100

i) ආවර්තිතා වගුවේ Y අයත් වන කාණ්ඩය කුමක්ද?

..........................................................................................

ii) එහි සංයුජතා කවච ඉලෙක්ට්‍රෝන වින්‍යාසය ලියන්න.

..........................................................................................

iii) Y කාමර උෂ්ණත්වයේදී වායුවක් ලෙස පවතී නම් එම මූලද්‍රව්‍ය හඳුනාගන්න.

..........................................................................................

iv) අදාළ මූලද්‍රව්‍යයන්ගේ ප්‍රථම අයනීකරණ ශක්ති විචලනය ආරෝහණ පිළිවෙලට දක්වා හේතු පැහැදිලි කරන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

v) Y මූලද්‍රව්‍ය හා X මූලද්‍රව්‍ය සංයෝජනයෙන් සෑදෙන සංයෝග 05 ක ගුණ ආම්ලික, භාෂ්මික, උදාසීන ලෙස විචලනය පහත සටහනෙහි ලියා දක්වන්න. (නිවැරදි මූලද්‍රව්‍ය සංකේත භාවිතා කරන්න.)

| සංයෝගය | | | | | |
|---|---|---|---|---|---|
| ආම්ලික/භාෂ්මික/උදාසීන ගුණය | | | | | |

vi) X හා Y මූලද්‍රව්‍යයන් සමඟ සැසඳීමේදී Z මූලද්‍රව්‍ය පෙන්වන විශේෂ ගුණ 03 ක් සඳහන් කරන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

vii) X හා Z මූලද්‍රව්‍ය සංයෝජනයෙන් සෑදෙන සංයෝගයේ ව්‍යුහ සූත්‍රය එහි හැඩය විදහා දක්වෙන ආකාරයට ඇඳ දක්වන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

viii) X, Y, Z මූල ද්‍රව්‍යයන්ගේ හයිඩ්‍රයිඩ වල තාපාංක විචලනය දළ ප්‍රස්ථාරයක සටහන් කරන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

ix) X හි හයිඩ්‍රයිඩයේ ඔක්සිහාරක හා ඔක්සිකාරක ගුණ විදහා දැක්වීමට තුලිත සමීකරණය බැගින් ලියන්න.

ඔක්සිහාරක : ..........................................................................................

ඔක්සිකාරක : ..........................................................................................

x) X හි හයිඩ්‍රයිඩයේ ජලීය ද්‍රාවණයක් Co හි +2 හා +3 ඔක්සිකරණ අවස්ථා සමඟ සාදන සංකීර්ණ වල අණුක සූත්‍ර ලියා ඒවායේ වර්ණය සඳහන් කරන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

(ලකුණු 6.0)

Scanned by CamScanner

b) A නැමති සුදු පැහැති අකාබනික සංයෝගය හඳුනා ගැනීම සඳහා සිදුකළ පරීක්ෂණ කිපයක් හා ඉන් ලද නිරීක්ෂණ පහත දක්වේ.

| පරීක්ෂණය | නිරීක්ෂණය |
|---|---|
| i) A ඝනය මතට ත. $H_2SO_4$ එකතු කරන ලදී | B නම් අවර්ණ වායුව හා C නම් අවර්ණ ද්‍රාවණය ලැබුණි. |
| ii) B වායුව ආම්ලික $K_2Cr_2O_7(aq)$ තුළින් බුබුලනය කරන ලදී. | කොළ පැහැති ද්‍රාවණයක් හා D නම් ඝන අවශේෂයක් ලැබුණි. |
| iii) ii හි ලද ජලීය මිශ්‍රණය පෙරහන් කඩදාසියක් භාවිතයෙන් පෙරා ගන්නා ලදී. | පෙරහන් කඩදාසිය මත ලා කහ පැහැති (සුදු පැහැයට හුරු) D ඝනය දක්නට ලැබුණි. |
| iv) D ඝනය ඉහළ උෂ්ණත්ව වලදී වාතය සමග ප්‍රතික්‍රියා කරවන ලදී. | E නම් අවර්ණ වායුව සෑදුණි. |
| v) E වායුව, B වායුවේ ජලීය ද්‍රාවණයක් තුළට බුබුලනය කරන ලදී. | අවර්ණ ජලීය ද්‍රාවණය තුළ D නැවත ලැබුණි. |
| vi) C ද්‍රාවණය තුළින් $NH_3$ වායුව වැඩිපුර බුබුලනය කරන ලදී. | පළමුව සුදු අවක්ෂේපයක් ලැබී පසුව එම අවක්ෂේපය දියවී අවර්ණ ජලීය ද්‍රාවණයක් ලැබුණි. |

i) A නමැති අකාබනික සංයෝගය හඳුනා ගන්න. (හේතු අනවශ්‍යයි)

.......................................................................................................................

ii) B, C, D, E ප්‍රභේද හඳුනා ගන්න. (හේතු අනවශ්‍යයි)

| B | C | D | E |
|---|---|---|---|
| | | | |

iii) (ii) පරීක්ෂණයට අදාළ තුලිත අයනික සමීකරණය ලියන්න.

.......................................................................................................................

iv) E වායුව භාවිත කරමින් සිදුකරන රසායනික කර්මාන්තයක් නම් කරන්න.

.......................................................................................................................

v) E වායුව තෙත වර්ණවත් පෘෂ්ඨ මත ගැටුණු විට සිදුවන විපර්යාසය සඳහන් කර එය තුලිත සමීකරණ භාවිතයෙන් පැහැදිලි කරන්න.

.......................................................................................................................

